# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2040/1 - 2017 ඔක්තෝබර් මස 09 වැනි සඳුදා - 2017.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : වීඉ/ඩීඑස්/එල්එල්ඩී/එල්/පීජ්ටීඑච්/02.
*අමාත්‍යාංශ අංකය* : 4-3/4/2013/D/147.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර:*

| | | |
|---|---|---|
| මුද්‍රිත පිඹුර | - | යා 2871 |
| ගම | - | පත්තමේනි |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | - | පත්තමේනි |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | වලිකාමම් නැගෙනහිර, කෝපායි |
| දිස්ත්‍රික්කය | - | යාපනය |
| පළාත | - | උතුර |

**ලොට් අංක 01**

ඉඩමේ නම: කුතන්තෝට්ටම්; ඉඩමේ විස්තරය: ස්ථිර ගොඩනැගිල්ල, තාවකාලික ගොඩනැගිල්ල, මෝටර් කාමරය, ළිඳ, වැසිකිළිය සහිත ඉඩම; හිමිකම් කියන අය: කේ. ඊ. චන්ද්‍රපාල; ප්‍රමාණය: හෙක්. 0.2946.

ඉහත සඳහන් *ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුනගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 නොවැම්බර් මස 13 වැනි දින පෙ.ව. 10.00 ට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 නොවැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සුභාගිනි මතියලාගන්,
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් නැගෙනහිර කෝපායි.

2017 සැප්තැම්බර් මස 28 වැනි දින,
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 619


මෙම *අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.



1A - G 26381 - 27 (2017/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.